# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2017 මාර්තු මස 03 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017. 03. 06 දින නිකුත් කරන ලදී)**


# අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතට 6අ වගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ පොලිස් අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තකු නියෝජනය කරනු ලබන නීතිඥවරයකුගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විධිවිධාන සැලසීම වේ.

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්. ඩී. — ඕ. 3/2017.

**2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක    දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2013 අංක 2 දරන පනතට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය, ඒ පනතේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:–

"පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකු වෙත ප්‍රවේශ වීමට නීතිඥවරයකුට ඇති අයිතිය.

6අ. (1) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකු නියෝජනය කරන නීතිඥවරයකුට, ඒ තැනැත්තා අත්අඩංගුවට ගනු ලැබූ වේලාවේ සිට, ඒ තැනැත්තා අත්අඩංගුවේ රඳවා සිටින පොලිස් ස්ථානය භාර නිලධරයා හමු වී ඒ තැනැත්තා නියෝජනය කරමින් ඔහු වෙනුවෙන් කරුණු දැක්වීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා අත්අඩංගුවේ රඳවා සිටින පොලිස් ස්ථානයට ප්‍රවේශ වීමට හිමිකම තිබිය යුතු ය.

(2) පොලිස් ස්ථානයට ප්‍රවේශ වීමට සහ කරුණු දැක්වීමට නීතිඥවරයකුට ඇති අයිතිය, නීතිඥවරයා විසින් නියෝජනය කරනු ලබන තැනැත්තා සම්බන්ධයෙන් පවත්වනු ලැබිය හැකි විමර්ශන කටයුතු කෙරෙහි බලපෑමක් ඇති නොකළ යුතු ය.

(3) එවැනි යම් නීතිඥවරයකුට, ඒ පොලිස් ස්ථානයට ඇතුලු වීමට අවසර දෙනු ලැබිය යුතු අතර, ඒ පොලිස් ස්ථානයට අනුයුක්ත පොලිස් නිලධරයන් විසින් ඔහුට හිතෛෂිව සහ ආචාරශීලීව සලකනු ලැබීමත්, සාධාරණ ලෙස සහ ඉවසීමෙන් යුතුව සවන් දීමත් කළ යුතු ය.

2—PL 005049 -475 (2017/02)

(4) එවැනි යම් නීතිඥවරයකුට, පොලිස් අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තා වෙනුවෙන්, පොලිස් ස්ථානය භාර නිලධරයා හමු වී පහත දැක්වෙන තොරතුරු සනාථ කර ගැනීමට හිමිකම ඇත්තේ ය:–

(අ) ඒ තැනැත්තා විසින් කරන ලදැයි කියනු ලබන වරද කවරක් ද යන්න ;

(ආ) ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබූ දිනය, වේලාව සහ ස්ථානය ;

(ඇ) ඒ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවනු ලබන දිනය, ආසන්න වශයෙන් වේලාව සහ ස්ථානය ; සහ

(ඈ) හෙළිදරව් කිරීම මගින්, වැඩිදුර විමර්ශන පැවැත්වීම කෙරෙහි සහ යුක්තිය ඉටු කිරීම කෙරෙහි හානිකර බලපෑමක් ඇති කරනු නොලබන, වෙනත් යම් තොරතුරු.

(5) එවැනි යම් නීතිඥවරයකුට-

(අ) ඒ තැනැත්තා වෙනුවෙන්, පොලිස් ස්ථානය භාර නිලධරයාට කරුණු දැක්වීමට ; සහ

(ආ) 1997 අංක 30 දරන ඇප පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව, ඒ තැනැත්තා වෙනුවෙන් ඇප ලබා ගැනීම සඳහා, පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට,

හිමිකම තිබිය යුතු ය.

(6) පවත්වාගෙන යනු ලබන විමර්ශන කටයුතුවලට අගතිගාමී ලෙස බලපාන්නේ නම් මිස, ඒ නීතිඥවරයා ඉල්ලා සිටින්නේ නම්, ඔහුට අත්අඩංගුවේ රඳවා සිටින තැනැත්තා වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබා දිය යුතු ය.

(7) එම නීතිඥවරයා විසින්, (5) වන උපවගන්තිය යටතේ කරුණු දක්වනු ලබන හෝ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, ඒ නිලධරයා විසින්–

(අ) එසේ කරන ලද කරුණු දැක්වීම පිළිබඳව වාර්තාවක් පිළියෙල කළ යුතු ය ;

(ආ) ඒ කරුණු දැක්වීමට නිසි සැලකිල්ල දැක්විය යුතු ය ; සහ

(ඇ) ඈප ඉල්ලීම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු වාර්තාගත කළ යුතු ය.

(8) මේ වගන්තිය යටතේ නීතිඥවරයකු විසින් සිදුකරනු ලබන කරුණු දැක්වීමකට සවන්දීමේ හැකියාවක් නොමැති තත්ත්වයක සිටින සෑම පොලිස් ස්ථානයක් භාර නිලධරයකු ම, ඒ කරුණු දැක්වීමට සවන්දීම සඳහා සුදුසු නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(9) මේ වගන්තියේ කාර්ය සඳහා "පොලිස් ස්ථානය භාර නිලධරයා" යන යෙදුමට එම පොලිස් ස්ථානය භාර නිලධරයා නියෝජනය කරනු ලබන වෙනත් යම් පොලිස් නිලධරයකු ද ඇතුළත් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.